**සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

--------------------------------------------------------------------

සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2017 නොවැම්බර් 30 දින පැවැත්වූ සාකච්ඡාවල සාකච්ඡා සටහන්වල ඇමුණුම II හි 12 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපාතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපාතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තෘතීයික රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපකරණ සහ ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම මගින් බෝ නොවන රෝග, විශේෂයෙන්ම හෘද කන්තුකවාහිනී රෝග හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍ය සේවාව වැඩිදියුණු කිරීම සහ එමගින්, ව්‍යාපෘති ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට දායක වීමයි. ණය ගිවිසුම සහ පවත්වන ලද සාකච්ඡාවල සාකච්ඡා සටහන් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 16,559 කට සමාන වූ ජපන් යෙන් මිලියන 11,352 ක් වන අතර ඉන් රු. මිලියන 15,519 කට සමාන වූ ජපන් යෙන් මිලියන 10,639 ක් මූල්‍යකරණය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ විය. ඉතිරි මුදල වන රු. මිලියන 1,040 මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 20 වන දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝබර් 20 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 වන වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම් පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2013 නොවැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 අනුව, ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය. කෙසේ වුවද, 2018 වර්ෂයේ ගෙවන ලද ජපන් යෙන් මිලියන 21.2 කට සමාන වූ රු. මිලියන 33.6 ක් වූ පෙර අවසන් ගාස්තුව (Front End Fee) මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ණය ගැණුම්කරු (මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව) විසින් පෙර අවසන් ගාස්තුව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූප අරමුදල් මගින් ගෙවා ඇත. | චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ පෙර අවසන් ගාස්තුව ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 262(2). | ගෙවන ලද සියලුම වවුචරවලත්, ඒවා තහවුරු කැරෙන ලියවිලිවලත් "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුවද, 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගෙවන ලද රු. මිලියන 26.8 ක් වූ වවුචර් දහහතක සහ ඒවා තහවුරු කැරෙන ලියවිලිවල එම මුද්‍රාව යොදා නොතිබුණි. | විගණන ප්‍රකාශය පිළිගන්නා අතර චෙක්පත ලියන අවස්ථාවේ දී, ගෙවන ලද සියලුම වවුචරවලත්, ඒවා තහවුරු කැරෙන ලියවිලිවල සියලු පිටුවලත් "ගෙවන ලදී" මුද්රාව යෙදිය යුතු බව දැක්වෙන එකී මුදල් රෙගුලාසිය තරයේ පිළිපැදිය යුතු බවට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති ගණකාධිකාරීවරයාට සහ ගිණුම් ශාඛාවේ කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දෙන ලදී. | ගෙවන ලද සියලුම වවුචරවලත්, ඒවා තහවුරු කැරෙන ලියවිලිවලත් "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ වාර්ෂික අරමුදල් අවශ්‍යතාවයට අනුව, 2020 දෙසැම්බර් 31 දින වන විට ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල ජපන් යෙන් මිලියන 607 කි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ තථ්‍ය වියපැහැදම් ගෙවීම්වලට අනුව, ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල ජපන් යෙන් මිලියන 92.7 ක් විය. ඒ අනුව, | ණය මුදලේ තථ්‍ය බල පවත්වන දිනය 2018 ඔක්තෝබර් 19 විය. නමුත්, උපදේශක සේවා ලබා ගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුම සඳහා නීතිමය අවසරය ලබා දීමේ දී, නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් මාස පහක ප්‍රමාදයක් සිදු වී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි, වාර්ෂික අරමුදල් අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ ණය උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය මගින් ණය ලබා ගැනීමේ ප්‍රගතිය 15.27 ක් වැනි අඩු ප්‍රතිශතයක පැවතුණි. | | |
| (ආ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයට අනුව, 2019 වර්ෂයේ දී ඉටු කිරීමට නියමිතව තිබුණු ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල සහ මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර ශික්ෂණ රෝහල්වල ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ බදුල්ල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල්, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර ශික්ෂණ රෝහල්, කොළඹ, කළුතර සහ පේරාදෙණිය වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී (MLT) පුහුණු පාසල් සහ කොළඹ ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය සඳහා උපකරණ සැපයීම සහ සවි කිරීම පිණිස සැපයුම්කරුවන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ උපදේශන කටයුතු 2022 අප්‍රේල් 30 දින වන විට ව්‍යාපෘතිය මගින් සිදු කරමින් පැවතුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වර්ෂ 2 ½ ක් පමණ ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ තථ්‍ය මුළු ප්‍රමාදය මාස නවයක් වූ අතර එම ප්‍රමාදය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් තොර විය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයට අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මෙම ව්‍යාපෘතියෙන් බදුල්ල මහ රෝහලේ නව හෘදරෝග ඒකකය සඳහා 2022 වර්ෂයේදී ජපන් යෙන් මිලියන 687 කට සමාන රු.මිලියන 929 ක් වටිනා උපකරණ ලබාදීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, එම හෘද රෝග ඒකකයේ ඉදිකිරීම් කටයුතු 2022 අප්‍රේල් 30 දින වන විට අවසන් කර නොතිබුණු බැවින්, සැලසුම් කළ පරිදි උපකරණ සැපයීමට සහ සවි කිරීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය හැකි බව නිරීක්ෂණය විය. | JICA ණය මගින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතියේ විෂයපථයට බදුල්ල පළාත් මහ රෝහලේ එකී ගොඩනැගිල්ල ඉදිකිරීම ඇතුළත් නොවේ. දේශීය අරමුදල්වලින් එයට අරමුදල් සපයනු ලැබේ. මේ වන විට, මුළු ඌව පළාතටම හෘද කැතීටරකරණ පහසුකම ලැබී නොමැත. කෙසේ වුවද, 2022 මාර්තු මාසයේ අවසානය වන විට, ඉදිකිරීම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 15 ක් සහ සියයට 21.5 ක් විය. | ව්‍යාපෘති කාලසීමාව තුළ දී, ව්‍යාපෘතිය මගින් ගිවිස ගත් උපකරණ සැපයීමට සහ ස්ථාපනය කිරීමට හැකි වන පරිදි බදුල්ල මහ රෝහලේ නව හෘද රෝග ඒකකය සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |